මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| සිංහල භාෂාව හා සාහිත්‍යය | 6 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

**ශිෂ්‍යයාගේ නම :-** ..............................................................................................................................

## I කොටස

❖ **පළමු කොටසෙහි අංක 1 සිට 20 තෙක් ඇති ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

- **අංක (01) සිට (03) තෙක් ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරන්න.**

01. ''මඩොල් දූව'' භාෂා රාශියකට ...................................... වූ රසවත් නවකතාවකි.

    (i) පරිවර්තනය (ii) පරිවර්ථනය

    (iii) පරිවර්තණය (iv) පරිවර්ථණය

02. ලංකාවේ ...................................... වාන පිහිටා ඇත්තේ කලා වැවේ ය.

    (i) විශිෂ්ටතම (ii) විශිෂ්ඨතම

    (iii) විශිශ්ටතම (iv) විශිස්ටතම

03. බෝධිසත්වයෝ මෙසේ .......................................... කොට ගත්හ.

    (i) අධිෂ්ඨාන (ii) අධිශ්ඨාන

    (iii) අධිස්ඨාන (iv) අධිෂ්ටාන

- **අංක (04) සිට (05) තෙක් ප්‍රශ්නවල ඉරි ඇඳි පදවලට ගැළපෙන ඉඟි වැකි තෝරා යටින් ඉරක් අඳින්න.**

04. උපාසිකාව <u>උදෑසනින් ම</u> පන්සල් ගියා ය.

    (i) නා කපන වැස්ස (ii) ගිනි ගහන අව්ව

    (iii) හොරගල් අහුලමින් (iv) කුකුළා අතින් ගෙන

05. නිමල් ගෙදර යන විට <u>තද වැසි</u> ඇති විය.

    (i) ගොළුබෙලි ගමනින් (ii) ගිනි ගහන අව්ව

    (iii) නා කපන වැස්ස (iv)ආ පයින් ම

- **අංක (06) සිට (08) දක්වා ප්‍රශ්න සඳහා දී ඇති වචනවලට සමානාර්ථය දෙන වචනය තෝරන්න.**

06. පිවිතුරු

    (i) ප්‍රසිද්ධ (ii) පවිත්‍ර (iii) පියකරු (iv) අලංකාර

07. ජලය

    (i) උදුල (ii) උදක (iii) උභය (iv) උවිඳු

08. ධවල

    (i) සුදු (ii) කළු (iii) රන්වන් (iv) රිදී



LIVEWORKSHEETS

- **අංක (09) සිට (11) දක්වා ප්‍රශ්න සඳහා දී ඇති වචනවලට විරුද්ධාර්ථය දෙන වචනය තෝරන්න.**

09. විදේශික
(i) ආදේශක (ii) ආයෝජන (iii) ස්වදේශික (iv) දේශික

10. සතුට
(i) ප්‍රීතිය (ii) සොම්නස (iii) නන්දනය (iv) දොම්නස

11. පුළුල්
(i) පළල් (ii) පටු (iii) අවුල් (iv) පවිටු

- **අංක (12) සිට (14) දක්වා ප්‍රශ්න සඳහා සුදුසු පිළිතුරු තෝරන්න.**

12. අපි බැති ගී පුහුණු ................................................
(i) උනෙමු. (ii) උනෙමි (iii) විය (iv) වූයේ ය.

13. ගොවියෝ කල් යල් බලා කුඹුරු ................................................
(i) වපුරයි. (ii) වැපිරුවේ ය. (iii) වපුරති. (iv) වපුරන්නේ ය.

14. ............................................ පාරේ වැඩ නිම කළහ.
(i) කම්කරුවෝ (ii) කම්කරුවා (iii) කම්කරුවන් (iv) කම්කරු

15. පහත දී ඇති පද අතරින් උක්ත නාම පදය දැක්වෙන පිළිතුර තෝරන්න.
(i) දරුවන් (ii) අප (iii) ඔවුන් (iv) ළමයි

16. පහත සඳහන් පද අතරින් අනුක්ත නාම පදය දැක්වෙන පිළිතුර තෝරන්න.
(i) මිනිසුන් (ii) අපි (iii) මම (iv) ගොවියෝ

17. ''කෞටිල්‍යා'' යන්නෙහි නිවැරදි පිල්ලම් යෙදෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.
(i) ගයනුකිත්ත, කොම්බුව, ඉස්පිල්ල, යංශය, ඇලපිල්ල
(ii) කොම්බුව, ගයනුකිත්ත, ඉස්පිල්ල, යංශය, ඇලපිල්ල
(iii) කොම්බුව, යංශය, ඇලපිල්ල, ගයනුකිත්ත, ඉස්පිල්ල
(iv) ගයනුකිත්ත, ඉස්පිල්ල, කොම්බුව, යංශය, ඇලපිල්ල

- **පහත වාක්‍යයන්හි ඇති හිස්තැන්වලට ගැළපෙන වචනය වරහනින් තෝරා ලියන්න.**

18. සැන්දෑවේ ............................................ (මල / මළ) හිරුගේ රැස් දහරින් හද ........................................ (මළ / මල) විකසිත විය.

19. පහළ ලන්දේ ............................................ (තන / තණ) කමින් සිටින එළදෙනගේ ........................................ (තණ / තන) බුරුල්ලෙන් පැටවා කිරි උරා බොයි.

20. ............................................ (වණය / වනය) තුළ අතරමං වූ ඇතින්න පාදයේ ........................................ (වනය / වණය) නිසා ඉමහත් පීඩා වින්දා ය.



LIVEWORKSHEETS